# ගුරු සේවයේ ස්ථාන මාරු සඳහා අයදුම්පත් කැඳවීම - 2022

## මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිදු කිරීම

### උපදෙස් සංග්‍රහය (පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය සඳහා)

1. 2022 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කර ඇති මාර්ගගත අයදුම්පත් මගින් පමණක් ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කිරීම අනිවාර්යය වේ. වෙනත් ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් වන ඉල්ලීම් ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා අදාළ කරගනු නොලැබේ.
2. මාර්ගගත අයදුම්පතට පිවිසීම සඳහා **https://nstt.moe.gov.lk** දිගුව භාවිත කරන්න.
3. මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා අදාළ උපදෙස් සංග්‍රහය **https://nstt.moe.gov.lk** දිගුව තුළද දක්වා ඇත.
4. අයදුම්පත් යොමු කළ හැකි කාලසීමාව **2022/04/17** දින සිට **2022/04/30** දින දක්වා වේ.
5. මාර්ගගතව සම්පූර්ණ කරන ලද ස්ථාන මාරු අයදුම්පතෙහි මුද්‍රිත පිටපත විදුහල්පති මගින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. එබැවින් අයදුම්පත්හි මුද්‍රිත පිටපත් අමාත්‍යාංශයට භාරගන්නා අවසාන දිනට පෙර **(2022/05/20)** අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමට හැකිවන පරිදි කල් වේලා ඇති ව තම ඉල්ලුම්පත් විදුහල්පති වෙත භාර දීම ගුරුභවතුන්ගේ වගකීම වනු ඇත. පෞද්ගලිකව අමාත්‍යාංශය වෙත එවනු ලබන ස්ථාන මාරු අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.
6. ගුරුභවතුන් තම ස්ථාන මාරු අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලිපි අමුණා එවිය යුතුය.
   i. මුල්පත්වීම් ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත
   ii. අවසන් වරට ඔබ වෙත නිකුත් කර ඇති ස්ථාන මාරු ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත
   iii. කාලසටහනේ විදුහල්පති සහතික කළ පිටපත
7. පළාත් පාසල් ඉල්ලුම් කරන්නේ නම් ඔබගේ අයදුම්පත සමඟ ඉහත ඇමුණුම් වලින් සමන්විත අයදුම්පත් කට්ටල **04** ක් ඉදිරිපත් කල යුතුය.
8. වෛද්‍ය කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම්, වෛද්‍ය සහතිකය අයදුම්පත්‍රයට අමුණා ඉදිරිපත් කළ යුතු වේ. වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේ දී පිළිගත් රජයේ වෛද්‍යවරයකු විසින් අදාළ රෝගී තත්ත්වය සනාථ කරමින් ඉදිරිපත් කරන වෛද්‍ය සහතික පමණක් පිළිගනු ලබන අතර ඖෂධ වට්ටෝරු හෝ සායනික සටහන් හා විවිධ වෛද්‍ය පරීක්ෂණ වාර්තා වෛද්‍ය සහතික ලෙස භාරනොගන්නා බව අයදුම්කරුවන් විසින් සැලකිය යුතු ය.
9. ඉහත 6, 7 හා 8 යටතේ යොමු කරන ලියවිලි හැර වෙනත් බාහිර පාර්ශවයන්ගේ නිර්දේශ සහිත ලිපි අයදුම්පත්‍රයට ඇමිණීමෙන් වැළකී සිටින ලෙස දන්වා සිටිමි. එසේ අමුණා එවීමෙන් විශේෂ වරප්‍රසාදයක් හිමි නොවන බව ද සැළකිය යුතුය.
10. අයදුම්පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් පසු කිසිදු ඇමුණුමක් භාරගනු නොලැබේ. අතිරේක ලිපි ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වරින් වර ඉදිරිපත් කිරීම ගුරුභවතුන් විසින් සිදු නොකළ යුතුය.

- ❖ අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කිරීම හා මුද්‍රිත පිටපත නියමිත දිනට පෙර විදුහල්පති වෙත භාරදීම ගුරුභවතුන්ගේ වගකීම වේ.
- ❖ භාරගන්නා අයදුම්පත් සියල්ල විදුහල්පති වෙත නිකුත් කර ඇති උපදෙස් මාලාවට අනුකූලව විදුහල්පති නිර්දේශ සහිතව අදාළ උපලේඛනය සමඟ නියමිත දිනට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දීම විදුහල්පතිගේ වගකීම වේ.
- ❖ විදුහල්පතිගේ ආවරණ ලිපියට බැහැරව කිසිදු අයදුම්පත්‍රයක් භාර නොගන්නා අතර වරින් වර අමාත්‍යාංශයට යොමු කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. මේ සම්බන්ධයෙන් යම් ගැටළුවක් පවතිනම් director.tt@emis.moe.gov.lk වෙබ් ලිපිනයට හෝ 011–2784434 අංකයට දැනුම් දිය හැක.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
පැලවත්ත,
බත්තරමුල්ල